# ලංකාවිත්ති
# LANKA VITHTHI

මවත් මව්බිමත් ස්වර්ගයට වඩා උතුමිය!
Mother and Motherland are nobler than Heaven



FOR FREE CIRCULATION
නොමිලේ බෙදාහැරීම පිණිසයි
VOLUME 13
NUMBER 06

ලොව කොතැනවුව වෙසෙන සිංහලයින් සඳහා ලන්ඩනයේ මුද්‍රිත සිංහල පුවත් පත
SINHALA LANGUAGE NEWSPAPER PUBLISHED IN LONDON FOR THE SINHALA READERS WHEREVER THEY ARE.

SEPTEMBER 10, 2010 සැප්තැම්බර් මාසය (බුද්ධ වර්ෂ 2554 බිනර මාසය http://www.lankaheritage.com/lankaviththi/




## Floods and the havoc
## ගංවතුර හා විනාශය

Up to **2. 5** million people have been affected by devastating floods in north-west Pakistan. In some areas entire villages were washed away without warning by walls of flood water. Rescuers are struggling to reach **27,000** people still cut off by the floods, which are the worst in **80** years. At least **1,100** people have died and thousands have lost everything.

This picture shows a Pakistani father who lost his home and everything in the disaster, holding tight his two little children, wades through the waters towards the rescuers.

අවුරුදු **80** කින් පකිස්ථානයේ සිදුවූ මහා ගංවතුර විනාශයේ ප්‍රමාණය මනින්නට බැරි තරම්ය. සමහර ප්‍රදේශ හා ගම් මුළුමනින්ම ගංවතුර ප්‍රවාහයෙන් යටවී සේදී ගොස් ඇත. මිලියන **2.5** ක ජනකායක් අනාථ වී සිටිති. 27,000 කට වඩා වැඩි දෙනෙකු සෙසු ප්‍රදේශ වලින් සම්පූර්ණයෙන්ම කැපී වෙන්වී තනිවී ඇති බැවින් ඔවුන් සිටින තැන්වලට ආධාර ගෙනියන්නටවත් ක්‍රමයක් නැත. මිය ගොස් ඇති සංඛ්‍යාව දැනට **1100** කි. බොහෝ දෙනෙකුට ඉතිරිව ඇත්තේ ඇඳගෙන සිටි වස්ත්‍රය පමණය.

මේ පින්තූරයෙන් දැක්වෙන්නේ එක් පකිස්ථානු පියෙක් දෑතට දරුවන් දෙදෙනද ඩැහැගෙන, බාගයක් ගංවතුරේ ගිලී, කවුරු හෝ තමා මුදාගන්නට ඒයයි බලා සිටින අයුරුය.

**ගං දිය සියළු දේ උදුරන් ගියේය**
**ඉතිරිව තිබෙන දේ ඇඳි වත වුයේය**
**එනමුදු එයට බැරිවුණ දේ පෙනේය**
**පියෙකුගෙ සෙනේහය නොම පැරදුණේය**

**Cruel floods plundered a country**
**Leaving them nothing but the loin-cloth**
**But obviously one thing it could not take**
**A father's unbeatable affection ever awake**

♦ *දයා ආනන්ද* ♦ *Daya Ananda Ranasinghe*

# බලන්! කඩතුරා හැර දැසේ.....

♦ සංජය විමලරත්න විසිනි

### සතුරන් සහ සැබෑ මිතුරන් හඳුනාගැනීම

තමන්ගේ සතුරන් හා මිතුරන් හඳුනාගෙන කටයුතු කරන්න යයි කිසියම් පුද්ගලයෙකුට සිය කටයුතු මනාව මෙහෙයවා ගැන්මට උදව් වන ලෙස සාමාන්‍යයෙන් දෙනු ලබන අවවාද යකි. මෙය පුද්ගලයෙකුට පමණක් නොව රටකට වුවද ඉදිරි කටයුතු යථා අන්දමින් සාර්ථකව කර ගැනීමට එහි පාලකයන්ට උදව් වෙන අවවාදයකි. මේ ලිපියේ අරමුණ වනුයේ අද පවතින තත්වයන් අනුව අප රටේ දියුණුවට මෙමඅදහස අනුකූල වන ආකාරය ගැන විමසුමකි.

දශක තුනක පමණ කාලයක් තුළ ත්‍රස්ත විරෝධී යුද්ධයක් සාර්ථකව ගෙන ගිය අප රටට සහ එහි නායකයින් ප්‍රමුඛව ජනතාවට මිතුරන් මෙන්ම සතුරන් රැසක් සිටි බව නොරහසකි. පසුගිය වකවානුව තුළ ජාතික සේම අන්තර් ජාතික වශයෙන්ද අප සතුරන් සහ මිතුරන් හඳුනාගෙන රටේ නායකයින් රටේ කටයුතු නිසි පරිදි මෙහෙයවමින් සතුරන්ට එදිරිව යුද්ධ කිරීම තුළින් අද අප විඳින සාමයේ ජයග්‍රහණය කරා එළඹීමට හැකි වූ බව නොරහසකි. මෙසේ මේ යථාර්ථය හඳුනාගෙන කටයුතු කරන්නට හැකිවූ සෑම විටකම අප රට ඉදිරියට ගමන් කළ බව නිදහස ලබා සෛවරී රාජ්‍යයක් වූ එදා සිට අද දක්වාම මුහුණ දුන් අප අන්තර් ජාතික කටයුතු විමසුමකින් පෙනී යනු ඇත.

### අප විදේශ පිළිවෙත පිළිබඳ ඓතිහාසික විමසුමක්

එදා **1948** දී අප රට නිදහස ලබන විට ලෝකය සැකැසී තිබුණේ එවිට බලවතුන් වූ ඇමරිකා, බ්‍රිතාන්‍යය සහ යුරෝපී අක්ෂය වටාය. ඉන්දියාවද අප මෙන්ම මේ කාලයේම වාගේ නිදහස ලැබුවද අන්තර් ජාතික වශයෙන් දුර්වල තත්වයක පැවතියේය. රුසියාවද විප්ලවයෙන් පසු සෝවියට් දේශය වශයෙන් දෙවන ලෝක යුද්ධයෙන් පසු ක්‍රමයෙන් ප්‍රබල වෙමින් පැව තිණ. චීනයද අධිරාජ්‍යවාදීන් ගෙන් එමට බැට කා **1949** චීන විප්ලවයට සැරසෙමින් සිටියාය.

**1950** ගණන් වලදී මෙම තත්වය වෙනස්වන්නට පටන්ගත්තේය. හිරු නොබසින අධිරාජ්‍යය යනුවෙන් විරුදාවලි ලබා සිටි මහා බ්‍රිතාන්‍යය යටතේ තිබූ යටත් විජිත රාශියක් ක්‍රමයෙන් එම අධිරාජ්‍ය ග්‍රහණයෙන් ගිලිහෙනවාත් සමග බ්‍රිතාන්‍යයේ බලය පිරිහෙන්නට පටන්ගත්තේය. ඒ වෙනුවට ඇමරිකාව සිය ආධිපත්‍යය තහවුරු කරගනිමින් සිටියා ය.

### 1950 දශකයේ අප රටේ වෙනස්වීම්

එක්දාස් නවසිය පණස් ගණන් වලදී අප රටේ ඇතිවූ සංස්කෘතික, සමාජීය සහ දේශපාලන පිබිදුම සමග අපද නිදහස ලබන කාලයේ තිබුණු විදේශ පිළිවෙතින් ඔබ්බට යමින් ගොඩනැගෙමින් තිබුණු මහා ලෝකය හඳුනාගනිමින් නව පිළිවෙත් සමග යාමට පටන්ගත්තෙමු. ඉන්දියාව ඒ වනවිට ගාන්ධි, නේරු, පටෙල් ආදී නායකයින්ගේ මග පෙන්වීම අනුව මෙලෙස නව මං සොයන්නට වූහ. **1956 දී** බණ්ඩාරනායක මහතාගේ ප්‍රධානත්වයෙන් මහජන එක්සත් පෙරමුණු ජනතා ආණ්ඩුව බලයට පැමිණීමෙන් පසු අපගේ විදේශ පිළිවෙතද නව පණක් ලබමින් අප රට වටා තිබුණු ආසියා, අප්‍රිකා නව නිදහස් රටවල් ද, රුසියාව, චීනය යුගෝස්ලෝවියා වැනි සමාජවාදී රටවල්ද නව මිතුරු දම් වලින් ඇඳෙන්නට පටන් ගැනිණ.

### නොබැඳි ජාතීන්ගේ සමුළුව සහ නොබැඳි පිළිවෙත

එවකට ලෝකයේ ධනවාදී ප්‍රබලයින් වූ ඇමරිකාව, ප්‍රංශය, ජර්මණිය, ඉතාලිය ආදී රටවල්ද ප්‍රමුඛව ධනවාදී කඳවුරුද, සමාජවාදී ප්‍රබලයින් වූ රුසියාව, චීනය යන ප්‍රමුඛ සමාජවාදී කඳවුරුද, යනුවෙන් අන්ත දෙකක් පැවතිණ. නව නිදහස ලැබූ රටවල් අතරේද ඉන්දියාව, ඊජිප්තුව, ඝානා, නයිජීරියා, ටැන්සානියා, යුගෝස්ලෝවියා ආදී ප්‍රබල රටවල් තිබුණි. ඒවායේ ඉන්දියාවේ නේරු, ඊජිප්තුවේ නසාර්, යුගෝස්ලෝවියාවේ ටිටෝ, චීනයේ චෞ එන්ලායි ආදී ලෝක ප්‍රසිද්ධ ප්‍රබල නායකයෝ වූහ.


**4 වන පිටුව බලන්න ➝**





ඔබේ මුදල් අදම යවන්න
අදම ලබාගන්න

FAST CASH
SEND TODAY - COLLECT TODAY

විස්තර පිටු අංක 3